


## අපේ යුතුකම

"ඔයා හරි උසයි නෞ මම අදයි හරියට දැක්කෙ...." කුරුප්පු අංකල් පින්සලට කිව්වා. කුරුප්පු අංකල් කියලා කිව්වෙ අපි අතර ඉන්න, අපි කවුරුත් දන්නා ඩී.බී. කුරුප්පු ලේඛක මහත්තයා.
පන්හිඳට ටිකක් ඉරිසියයි වගේ. පන් ඒ තරම් ම උස නෑනේ. "උස වුණාට වැඩක් නෑ. උසස් වෙන්නයි ඕන. උසස් දේවලුයි කරන්න ඕන." පන් තනියම මුමුණා ගත්තා.

'සෙව්වන්දිගෙ වැඩේට නාපු කෙනෙක් නෑ වගේ" " නෙතඟ නිලුපුල්" ගීත ප්‍රසංගය ඉවර වෙලා එළියට බහින ගමන් පින් වටපිට බල බලා කිව්වා.
"ඇයි මේකට එනකොට නාලා එන්න කියලා තිබුණාද?" පන්ට එදා නාගන්නවත් වෙලාවක් තිබුණේ නෑ ඇත්තටම.
"සමහරුනට ඉතින් වැඩක් කරන්න ගියාම නා ගන්නව තමයි ෟ" ..නිකං නෙවෙයි ඇදගෙන නාගන්නේ" පන්, පින්ට එකතු වුණා.

සිංහල පදවල අරුමය වේදිකාවෙනුත් දකින්න ලැබුණානේ. ඇත්තටම හරිම අපූරු වැඩක්. කාටවත් කතා කරන්න ඉඩක් නොතියා වැඩේ හොඳට ගියා...."

තමන්ට ලැබුණ "නෙතඟ නිලුපුල්" ගීත එකතුව අහන්න දෙන්නා පටන් ගත්තේ වාහනයෙදිමයි. ප්‍රසංගයේදී අහන්න වගේම බලන්නත් බෝම දේවල් තිබුණ නිසා නිවී සැනසිල්ලේ සින්දු ටික අහන්න දෙන්නටම ඕනකම තිබුණි.
එකකට එකක් නොදෙවෙනි සින්දු. අගේ ඇති පද රචනා. තනු රචනා, සංගීත රටා. සෙව්වන්දිකාගේ ගායනා ගැන අමුතුවෙන් කියන්න දෙයක් නෑනේ ඉතින්. එක දිගටම අහගෙන ඉන්න පුළුවන් මිහිරි ළයාන්විත හඬක් තමන්ගේ ඉගෙන ගත්ත ශිල්පවලින් ඔප කරලා.
සින්දු අහලා ඉවර වුනේ ගෙදර දී. වෙහෙසටද මන්දා පින්ට එහෙම්මම වැටිලා නින්ද ගියා. පටන් නින්ද යන්නෙ නෑ. මොනවා හරි ලියන්නම යි හිත.



"කලක පටන් ලියා ගන්නට නොහැකි වූ යමක් සිත තුළ තෙරපෙයි. එය සටහන් කොට තබන්නට සුදුසුම දිනය එළැඹ ඇති සේ දැනේ. අතීතයේ එක්තරා සිද්ධියක් වෙත සිත ඇදී යයි. මව්බිම අතැර මෙල්බර්න් නුවරට සපැමිණි දිනය මුලින්ම මතකයට නැංවේ. මිහිඳු මහරහතන් වහන්සේ ලක්බිමට බුදු දහම ගෙන ආ දා පටන් කළ කී සියලු දෑ මව් බිමෙම තබා හිස් අතින් නවමු සංස්කෘතියකට පා තැබූ දිනයයි ඒ. දෑස් මවිතයට පත් කරමින් ගුවන් තොටෙහි වූයේ අප දයාබර සගයින් වූ නිමල් අබේසේකරන්, ජගත් ජේ. එදිරිසිංහත් ය.

ගුවන්තොටින් අප ඩැහැගත් ජගත් කෙළින්ම පියඹා ගියේ වරුණ සාවින්ද නම් වූ නිර්මාණකරුවාගේ නිවෙස්නයටයි. එදින ඉතා හැඟීම් බර දිනයක් වීය. එකිනෙකාගේ හදවත් විවෘත කර ගනිමින් සංවේදී වූ වරුණ සහ ජගත් සිය කඳුලින් අප සමඟ මුහු වූහ. ඒ මව්බිමෙන් වියෝවීම නිසාවෙන් අපහට අහිමි වූ නිර්මාණකරණයේ තෝතැන්න වෙනුවෙනි. අප සියල්ලටම දැනුනේ දරාගත නොහී පාළුවකි, වේදනාවකි. ඒ නිසා නැගුණ කඳුලුය සියළු නෙත්වලට ඉනුවේ.
රෝස් පාන් කෑමට සෙව්වන්දි පිළියෙල කල පරිප්පු ව්‍යංජනයේ සුවඳින් අපි පියවි ලොවට පිළිපන්නෙමු. ශ්‍රී පාලි කදිම පොල් සම්බෝලයක් සදමින් සිටියාය. සත් සමුදුරකින් එතෙර මව්බිමේ තනිකරදා ආ නිර්මාණ ගොනුව මෙහි ගෙන්වා ගන්නට හේතුවූයේ ඒ ව්‍යාංජනයේ සුවඳ නොවේද? ඒ සම්බෝලයේ රසය නොවේද?

මව්බිමේ සුවඳ, රසය කැවුණ බොහෝ දෑ මෙනුවරද එලෙසින්ම ඇති බව වටහා ගත්තේ ඔවුනගෙනි. ඔවුන්ගේ මුවින් ගැයුමක් ගැයෙන තුරු බලා සිටියෙමි මම. වසර දෙකහමාරක් තිස්සේ බලා සිටියෙමි මම. ශ්‍රීපාලිය පසුගියදා සිය ගීත එකතුව " සුදු තාරකා" නමින් එළිදැක්වූවාය. සෙව්වන්දිය ද අද ඇයගේ "නෙතඟ නිළුපුල්" ගී සරණිය පිළිගැන්වූවාය. අප මුල අමතක කළ යුතු නොවේ. ලේඛකයකු ලෙසින් මෙනුවර පාඨකයා අතරට එන්නට, රචකයකු වශයෙන් මෙනුවර රසිකයා සමඟ සරන්නට මං පෑදු ඔවුන් සියල්ලහට පුන්‍යානුමෝදනා කිරීමට සුදුසුම දිනයයි මේ. පන් පොඩි විරාමයකට ලියවිල්ල නැවැත්තුවා.

මෙරට නිර්මාණ එළිදැක්වූයේ සෙව්වන්දිකා අබේරත්න, ශ්‍රීපාලී එදිරිසිංහ පමණක්ම නොවේ. නම් වශයෙන් සටහන් කළ නොහැකි තරම් ප්‍රමාණයක් ශිල්පී

***<u>ඉහත කී හේතූන් පිළිබඳව සළකා බලන කල තාක්ෂණික, ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා ලිඛිත මාධ්‍යවලින්ද ඉටු වියයුතු විශේෂ යුතුකමක් ඇත්තේය. තම මාධ්‍යයන් තුළින් හැකි පමණ මෙරට නිර්මාණ කරුවන් හා ශිල්පීන්වද රසිකයට හඳුන්වාදීමයි ඒ.</u>***

ශිල්පිනියෝ සිය නිර්මාණ දොරට වැඩූහ. පළමු පරම්පරාවේ මතු නොව දෙවන පරම්පරාවේ දූ දරුවවෝ පවා සාර්ථක නිර්මාණ එළිදැක්වූහ. ඔවුන් සිය කාලය ධනය, කැපකරමින් වෙහෙස නොබලා මෙම නිර්මාණ රසිකයනට පිළිගන්වන්නේ හුදෙක් ආත්ම තෘප්තිය නිසාම නොවේ ද? නොහුරු පරිසරයක, නොගැලපෙන පහසුකම් මධ්‍යයේ හෙළ ගී ආරය පෙරදැරි කරගත් මෙම නිර්මාණ අවර ගණයේ ඒවා නොවේ. දහසකුත් එකක් ජීවන ගැටලු මධ්‍යයේ නිසියාකාර පුහුණුවක් පවා නොලබා කෙරුණද එම ගීත දෙවෙනි තැන්හි ලා ගිණිය නොහේ. ඉහත කී හේතූන් පිළිබඳව සළකා බලන කල තාක්ෂණික, ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා ලිඛිත මාධ්‍යවලින්ද ඉටු වියයුතු විශේෂ යුතුකමක් ඇත්තේය. තම මාධ්‍යයන් තුළින් හැකි පමණ මෙරට නිර්මාණකරුවන් හා ශිල්පීන්වද රසිකයට හඳුන්වාදීමයි ඒ. මව්බිමේදී අපට හුරුවූ නිර්මාණ රස විඳීමට අවස්ථාව සළසාදීම අවශ්‍ය බව සැබැවි. මව්බිමේ කෙරෙන නව නිර්මාණ ද හඳුන්වාදීම වැදගති. අප සැමදාම සිහිපත් කරන්නා සේ මව්බිමෙන් අප වෙන්වූදා සිට එහි ක්‍රියාදාමයන් නැවතී නැත්තේය. මේ සියල්ල අතරින් මෙරට, මෙනුවර අප උප සමාජ කුලකයෙන් නැගෙන නිමැවුම් ද අගැයීම අපගේ යුතුකමක් වන්නේමය. එය ගී වලටම සීමා නොවේ. වේදිකා නාට්‍ය, නර්ථන අංග, චිත්‍රපට, ටෙලිනාට්‍ය, ලේඛණ කලාව අනුබද්ධිත අංග, සිතුවම් කලා, කැටයම් යනාදී සියලුම කලාවන් අද මෙනුවරුන් අතින් නොකෙරෙන්නේද? දේවානම්පියතිස්ස රජ දවස බොදු සමය සමඟ මව්බිම ලත් සියලු දායාදයෝ අද මෙරටට සංක්‍රමණය වූ හෙළයන් අතර නොවෙයිද?

"ගර්ර්ස්.... ෆුස්.... ටොක් ! ගර්ර්ස්.... ෆුස්... ටොක් !! .....
මොකද්ද බොලේ ඒ සද්දේ? පන් ගැස්සිලා බැලුවා. පින් අමුතුම තාලයකට නින්දෙන් ගොරවනවා. ඒකත් හරියට සාවින්ද ළමයගෙ අලුත් වැඩක් වගෙයි. ■




